**දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව**
**කොළඹ දිස්ත්‍රික්කය**
**------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයේ සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 28 දින නාගරික කොමසාරිස් වෙත යවා ඇත.

## 1.2. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරන අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් ප්‍රමාණය නිරවුල්කර නොගෙන ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණය විසින් සියළුම නඩුවලට අදාළව අයකරගත් දඩ මුදල වූ රු. 38,058,207 ක් සභාවේ ආදායම ලෙස දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල ආයතනික සම්පත් සැලසුම්කරන මෘදුකාංග පද්ධතියක් හඳුන්වාදීමට අපේක්ෂා කළද වියදම් දැරීමක් හෝ කාර්යය ඉටුකිරීමක් සිදුවී නොතිබුණු බැවින් ණයහිමි වටිනාකම රු.9,152,800 ක් වැඩියෙන් හා ආදායම් වියදම් ගිණුමේ අතිරික්තය රු.10,000,000ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ජංගම වත්කම් යටතේ අගරු චෙක්පත් වටිනාකම රු.707,324 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර අගරු චෙක්පත් ලේඛනය අනුව එම වටිනාකම රු.971,632 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් රු.264,308ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) කසල ඉවත් කිරීම වෙනුවෙන් ජාතික සත්වෝද්‍යානයෙන් 2016 දෙසැම්බර් 31 දිනට අයකරගතයුතු වටිනාකම රු.85,563ක් මූල්‍ය ප්‍රකාශනවල නොදැක්වීම නිසා එම ප්‍රමාණයෙන් ජංගම වත්කම් (වෙනත් හිඟ ආදායම්) අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) කසල ඉවත්කිරීම වෙනුවෙන් 2016 වර්ෂය සඳහා අපද්‍රව්‍ය කලමණාකරන අධිකාරියට ගෙවිය යුතු මුදල රු.46,952,956 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂයේ වියදම රු.47,307,277 ක් වුයෙන් මූල්‍ය ප්‍රකාශනවල වියදම රු.354,321 ක් වැඩියෙන් දක්වා තිබූ අතර ණයහිමියන්ද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු දේපල ණය පොලී ප්‍රතිපූර්ණ වටිනාකම රු.874,373 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.371,005 ක් වශයෙන් දැක්වීම නිසා රු.503,368 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) විගණනයට ඉදිරිපත්කරන ලද උපලේඛනය අනුව 2016 දෙසැම්බර් 31 දිනට වැඩිපුර අයකරගත් සේවක ණය මුදල් එකතු වටිනාකම රු.304,197 ක් වූ අතර එම ශේෂය ශේෂ පත්‍රයේ ජංගම බැරකම් යටතේ නොදැක්වීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ජංගම බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුල ආරම්භ කිරීමට අපේක්ෂා කල ජයසිංහ සමරු රඟහලේ ගිනි නිවන කට්ටලය සඳහා රු.20,000,000 ක මුදලක් ණයහිමියන් ලෙස ප්‍රතිපාදනයකර තිබුනද මෙම මුදල් උපයෝජනය කර නොතිබුණු බැවින් ප්‍රග්ධන වියදම් හා ණයහිමි වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(එ) ස්ථාවර වත්කම් වටිනාකම රු.2,734,163 ක් අඩුවෙන් හා ක්ෂය වටිනාකම රු.389,108 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) බාහිර පාර්ශවයන් විසින් සභාවට පවරාදී තිබූ වාහන 4ක් තක්සේරුකර ගිණුම්වලට ගෙන නොතිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 655,312,647 ක් වූ ගිණුම් විෂයයන් 14 කට අදාල ශේෂයන් ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම් රු. 26,679,027 ක් ද, වැඩියෙන් දැක්වීම් රු. 9,306,579 ක් ද නිරීක්ෂණය විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත්කර තිබුනු හිඟ ආදායම් වාර්තාව අනුව ආදායම් වර්ග 5 ක මිශ්‍ර ආදායම් හිඟ ශේෂය රු.292,360,119 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.348,732,242ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.56,372,123 ක වෙනසක් පැවතුණි.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) 2002 සිට 2016 වර්ෂය දක්වා සභාව වෙත ලැබුණු රු.968,185 ක් වටිනා චෙක්පත් අගරුවී තිබූ නමුත් අයකරගැනිමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට අය නොවී පවතින වාහන, ආපදා, උත්සව හා විශේෂ යන ණය වර්ගවලින් සමන්විත සේවක ණය ශේෂය රු.4,891,554ක් වූ අතර මෙම ණය මුදල් වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී පැවතුණි.

(ඇ) මු.රෙ. 570 හා 571 ප්‍රකාරව වර්ෂ 2 ක් ගත වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවද,2016 දෙසැම්බර් 31 දිනට එසේ බැර නොකළ තැන්පත් වටිනාකම රු.21,009,391ක් විය.

(ඈ) 2006 හා 2007 වර්ෂයන්ට අදාල රු.121,456 ක් වූ දේපල ණය පොලී ශේෂය පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2013, 2014 හා 2015 යන වර්ෂවලට අදාලව හිඟ සහික දීමනා මුදල් රු.6,379,000 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ඊ) මිශ්‍ර ආදායම් ලැබිය යුතු ශේෂ තුල 2014 වර්ෂයට පෙර සිට පැවත එන මස් කඩකුලී හිඟ ශේෂය වූ රු.2,356,017 ක් හඳුනා ගෙන අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතු වටිනාකම රු.138,842,749 ක් වූ ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් අදාළ සාක්ෂි නොලැබීම නිසා සතුටුදායක ලෙස තහවුරු කරගත නොහැකි විය.

### 1.3.5 බලය නොලත් ගණුදෙනු

මහා නගර සභා ආඥා පනතේ 188(1) වගන්තියට පටහැනිව මාසික මහා සභා රැස්වීමට සහභාගී වන නිලධාරීන්ට නිල ඇඳුම් ලබාදීම වෙනුවෙන් 2015 වර්ෂයේදී ගෙවා තිබූ රු.235,000 ක් සමාලෝචිත වර්ෂය තුලදීද අයකරගෙන නොතිබුණි.

### 1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 218 වැනි වගන්තිය 286 (අ) | - | මුදල් වර්ෂය ඉක්මවූ පසුව එක් එක් වර්ෂය සඳහා සභාවේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් නාගරික කොමසාරිස්වරයා විසින් මුල්‍ය ප්‍රකාශන සමඟ හැකි ඉක්මනින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් එවැනි වාර්තාවක් සකස් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| (i) | xxiv (13.6) | 145,150 | මාස 12 ක කාල සීමාවක් සඳහා උත්සව අත්තිකාරම් ගෙවිය හැක්කේ එක් වරක් පමණක් වන නමුත්, එයට පටහැනිව කලින් ගත් ණය මුදල් සම්පූර්ණයෙන් අයකර නොතිබියදී සභාවේ සේවකයන් 10 දෙනෙක් සඳහා උත්සව අත්තිකාරම් මුදල් ලබා දී තිබුණි. |
| (ii) | Viii වැනි පරිච්ඡේදයේ 2:1 උපවගන්තිය | - | කරන ලද වැඩ පිළිබඳ කිසිඳු වාර්තාවක් ඉදිරිපත් කිරීමකින් හෝ අතිකාල අයදුම්පතෙහි සඳහන් කිරීමකින් තොරව අතිකාල ගෙවීම් කර තිබුණි.<br><br>ඇතැම් රියදුරන් තම පැවරී ඇති රාජකාරිය ඉටුකර වාහනාංගනයට වාහන ඇතුල් කිරීමෙන් පසුවද රාත්‍රී 10 පමණ තෙක් රාජකාරි ඉටුකල බව සඳහන් කරමින් අතිකාල දීමනා ලබාගෙන තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | Viii වැනි පරිච්ඡේදයේ 3:1 උපවගන්තිය | - | අතිකාල වැඩ සඳහා මුදල් වැය කල යුත්තේ අදාල කටයුත්ත ඉටුකිරිමට අන්කිසිම මාර්ගයක් නොමැති අතිවිශේෂ අවස්ථාවලදී පමණක් වුවත් සභාවේ සේවකයින්ට තම නියමිත රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් දිගින් දිගටම අතිකාල ලබාදී තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (මු.රෙ.)<br>------------------------------------------ | | |
| (i) | 104(2)(3)(4) | - | 2015 සිදුවූ හදිසි අනතුරු 5 සම්බන්ධයෙන් විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුන අතර ප්‍රාරම්භක හා පූර්ණ වාර්තා සකස්කර නොතිබුණි. |
| (ii) | 110 | - | හානි හා පාඩු ලේඛනයක් නඩත්තුකර නොතිබුණි. |
| (iii) | 177(1) | 26,495 | රැස්කරගන්නා ලද ආදායම් දිනපතා හෝ හැකිතාක් කලින් බැංකුගත කළ යුතු වුවත් දෛනිකව රැස්කරගනු ලබන නැවතුම්පොළ ගාස්තු කාල ප්‍රමාදයන් සහිතව පියවා තිබුණි. |
| (iv) | 188 (2) | 48,683 | 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් කල නමුත් උපලබ්ධි නොවු චෙක්පත් 5 ක් හා මුදල් ඇණවුම් 2 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |
| (v) | 341 | - | උපපත්‍රිකා පොත් පිළිබඳ විස්තර ජී.ඒ.එන් 20 ආකෘති ප්‍රකාරව ලේඛනයක සටහන් කර නොතිබුණි. |
| (vi) | 342 | - | නිකුත් කල උපපත්‍රිකා පොත් ආපසු භාර නොගෙන නැවත උපපත්‍රිකා පොත් නිකුත් කළ අවස්ථා පැවතුණි. |
| (vii) | 371(5) | 440,169 | අත්තිකාරම් ලබාගත් වර්ෂයේ දෙසැම්බර් 31 දින හෝ එදිනට පෙර නිරවුල් කලයුතු වුවද 2016 දෙසැම්බර් 31 දිනට නොපියවන ලද රු.440,169 ක එකතු අත්තිකාරම් ශේෂයක් පැවතුණි. |
| (viii) | 396 (ඇ) | 103,810 | 2016 දෙසැම්බර් 31 දිනට නිකුත්කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවු එකතුව රු.103,810ක චෙක්පත් 27ක් සම්බන්ධයෙන් 2017 මැයි 30 වන විටත් කටයුතු කර නොතිබුණි. |
| (ix) | 1653 | | වාහනවල මයිලෝ මීටරය ක්‍රියාවිරහිත වූ විට ඉක්මනින් අලුත්වැඩියා කරගත යුතු වුවද වර්ෂ කීපයක සිට මයිලෝ මීටරය අක්‍රිය වූ වාහන 31 ක් සභාවේ තිබුණි. |

(ඇ) <u>චක්‍රලේඛ</u>

| | | | |
|---|---|---|---|
| | 2012 ජුලි 11 දිනැති අංක WP/LGD/01/2012 දරන පළාත් පාලන කොමසාරිස් (බ.ප)ගේ චක්‍රලේඛයේ | - | |
| (i) | (xvi) ඡේදය | | සැලසුම් කමිටු පැවැත්වියයුතු කාලය පැය 2 කට වඩා වැඩිවිය යුතු වුවද අඩු කාලයක් පවත්වා තිබූ සැලසුම් කමිටු සඳහා දීමනා ගෙවා තිබුණි. |
| (ii) | (xxi) ඡේදය | - | අනවසර ඉදිකිරීම් හා ගොඩකිරීම් ආදි කටයුතු සම්බන්ධව ගනු ලබන තීරණ පිළිබඳව ත්‍රෛයිමාසික වාර්තාවක් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත්කර නොතිබුණි. |
| | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වන ඡේදය | - | සභාව සතු වාහනවල ඉන්ධන දැවීම පරික්ෂාකර නොතිබුණි. |
| | 2016 පෙබරවාරි 29 දිනැති අංක 01/2016 දරන පාලන චක්‍රලේඛ 1:2:13 ඡේදය | - | පළාත් පාලන ආයතනවල නගරාධිපතිවරු/ සභාපතිවරුන් නිල වාහනයක් ලෙස නිශ්චිත වාහනයක් භාවිතා කරන්නේ නම් ඒ සඳහා උපරිම ඉන්ධන සීමාව තීරණය කිරීම සඳහා සම්මත කරන ලද යෝජනා සම්මුතියක් තිබිය යුතු වුවද සභාවේ තනතුරු 03 ක් වෙනුවෙන් උපරිම සීමාව ඉක්මවා සීමා රහිත ඉන්ධන ප්‍රමාණයක් සඳහා සභා සම්මුතියක් ගෙන තිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.349,470,297 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.312,450,626ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

--------------------

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------

(i) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව විගණනයට ඉදිරිපත්කරන ලද තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016 තථ්‍ය අයකරගත යුතු | තථ්‍ය අයකරගත් | වර්ෂයට හිඟය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2015 තථ්‍ය අයකර ගතයුතු | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 363,007 | 202,934 | 160,073 | 3,519 | 364,509 | 344,899 |
| බදු කුලී | 17,966 | 13,752 | 4,214 | 9,845 | 17,299 | 9,874 |
| බලපත්‍ර ගාස්තු | 40,546 | 20,232 | 20,314 | 33,296 | 25,813 | 21,916 |
| වෙනත් ආදායම් | 406,242 | 356,794 | 49,448 | 413,704 | 355,081 | 404,048 |

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වරිපනම් සමුච්චිත හිඟය 3,519,000 ක් වුවද 2016 වර්ෂයේ පමණක් හිඟය රු.160,073,000 ක්ව තිබුණු බැවින් සමුච්චිත හිඟය රු.3,519,000 ලෙස දැක්වීම ගැටළු සහගත විය.

### 2.2.2 වරිපනම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා වන බිල් කරන ලද වරිපනම් ආදායම රු.342,743,498 ක් වුවද ඉන් වර්ෂය තුලදී රු.230,296,826 හෙවත් සියයට 67ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ අවසානයට වරිපනම් ණයගැති හිඟ ශේෂය රු.341,029,867 ක් වූ අතර එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.169,197,413ක් හෙවත් සියයට 50 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට රු.306,489,840 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ රුපියල් 50,000 ට වැඩි වටිනාකමකින් යුත් වරිපනම් ඒකක 1148 ක් වූ අතර ඒවායින් අයවිය යුතු වරිපනම් බදු ශේෂය රු.149,294,346 ක් විය.

(ඈ) ඉකුත් වර්ෂය අවසානයට හිඟ වරිපනම් ශේෂය රු.341,029,867 ක් වූ අතර ඉන් රු.8,641,540 ක් අනුමැතියකින් තොරව කපා හැර තිබුණි.

(ඉ) 2016 නොවැම්බර් 08 දිනැති විශේෂ කළමණාකරණ කමිටුවේ නිර්දේශ මත එකම පුද්ගලයකුට අයිති ගොඩනැගිල්ලක ස්ථාන 10 කට අදාළව 2013 සිට 2016 දක්වා කාල පරිච්ඡේදය සඳහා අයවිය යුතු වරිපනම් බදු වටිනාකමින් රු.505,798 ක මුදලක් අදාළ තහවුරු කිරීම් ලබා නොගෙන කපා හැර තිබුණි.

(ඊ) මහා නගර සභා ආඥා පනතේ 240 (3) වගන්තිය අනුව බදු අඩුකිරීමක් සඳහා ඉඩදෙනු ලබන කාල සීමාව එම ගොඩනැගිල්ලේ තැනැතියාව නොමැතිව පවතින බවට වූ ලිඛිත දැන්වීමක් මහා නගර සභාවට ලැබුණු දිනයෙන් ආරම්භව එය නැවත පදිංචියට ගත් දිනයෙන් අවසන් විය යුතු වුවද ඇතැම් වරිපනම් ඒකකවල ලිඛිතව දැන්වීම කල දිනට පෙර කාල වලට අදාලවද වරිපනම් බදු අඩුකර තිබුණි. එසේ වුවද එම කපාහැරීම්වල නිත්‍යානුකූල බව තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය සාක්ෂි ලබාගෙන නොතිබුණි.

**2.2.3** ව්‍යාපාර බදු

-------------

(අ) සමාලෝචිත වර්ෂයේ ව්‍යාපාර බදු ආදායම ලෙස රු.15,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණද රු.22,205,859 ක් බිල්කර තිබුණි. එයින් සමාලෝචිත වර්ෂය තුළ රු.5,573,055 ක් එනම් සියයට 25 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට පැවති රු.21,458,368 ක ව්‍යාපාර බදු ණයගැති ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.5,695,625 ක් එනම් සියයට 27 ක් පමණක් අයකරගෙන තිබුණි.

**2.2.4 කසළ ආදායම්**

----------------

කසළ ඉවත් කරනු ලබන ව්‍යාපාරික ස්ථාන හා සභාව අතර ගිවිසුම් ගත බැදීමක් නොමැති බැවින් හිඟ කසල ගාස්තු අයකිරීමේ දී නීත්‍යානුකූලව කටයුතු කල නොහැකිව තිබුණි. 2003 නොවැම්බර් 18 දිනැති අංක 08 (10) 35 දරන සභා තීරණය හා මුදල් කාරක සභාවේ උපදෙස් පරිදි හිඟ කසළ ගාස්තු අයකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට හිඟ කසළ ආදායම රු.1,886,150 ක් විය.

**2.2.5 මුද්දර ගාස්තු**

-------------

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර තිබූ ගිණුම්කරන ප්‍රතිපත්තිය අනුව ගිණුම් වර්ෂයට පෙර වර්ෂය තුල සිදුවූ ඉඩම් හුවමාරු ගණුදෙනුවලින් උපචිත වූ මුද්දර ගාස්තු ආදායම ගිණුම් වර්ෂයේ ආදායම ලෙස සලකන බව දන්වා තිබුණද 2012,2013,2014 හා 2015 යන වර්ෂවලට අදාල ඉඩම් හුවමාරු ගනුදෙනුවලින් ලද රු.267,888,706 ක් වර්ෂයේ ආදායම ලෙස ගිණුම්වලට ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගතකර තිබූ මුද්දර ගාස්තු ආදායම රු.240,000,000ක් වුවද ඉන් කිසිදු මුදලක් වර්ෂය තුල ලැබී නොතිබුණි.

**2.2.6 උසාවි දඩ**

------------

(අ) 2016 වර්ෂය සඳහා අයවැයගතකර තිබූ උසාවි දඩ ආදායම රු. 33,227,000 ක් වුවද තථ්‍ය ආදායම රු. 210,581 ක් විය.

(ආ) 2012, 2013, 2014 හා 2015 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතුව ඇති රු. 116,173,231 ක් වූ උසාවි දඩ හිඟ ආදායම් ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය තුල දී කටයුතු කර නොතිබුණි. 1994 අංක 04 දරන උසාවි දඩ මුදල් හා දඩ පැවරීමේ ප්‍රඥප්තියේ විධිවිධාන පරිදි දඩ මුදල් අයකරනු ලැබූ වර්ෂයේ දෙසැම්බර් 31 දින සිට වර්ෂ 5 ක් ඇතුළත ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු වුවද එසේ ඉදිරිපත් කර නොතිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) <u>දැන්වීම් පුවරු ආදායම්</u>

2015 අගෝස්තු 21 දිනැති අංක 1929 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ 2016 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගාස්තු පැනවීම සම්බන්ධයෙන් වූ නිවේදනය අනුව සභා බල ප්‍රදේශය තුල ප්‍රචාරක දැන්වීම් පුවරු හා බැනර් ප්‍රදර්ශනය කිරීමේදී ගාස්තු අයකල යුතු වුවද ගාලු පාර විලියම් හන්දියේ සිට ජයලංකා හාඩ්වෙයාර් දක්වා වූ ගාලු පාර දෙපස සීමාව තුල පමණක් ස්ථිර දැන්වීම් පුවරු 35කින් 2016 වර්ෂය සඳහා රු.510,700 ක් වූ ගාස්තු අයකර නොතිබුණි.

(ආ) <u>වෙළඳ ස්ථාන කුලී</u>

(i) සභාව සතු කඩකාමර සංඛ්‍යාව ආසන්න වශයෙන් 371 ක් වූ අතර මූලා ප්‍රකාශන අනුව 2016 වර්ෂය සඳහා ආදායම රු. 6,224,259 ක් විය. කඩ කාමර 371 න් 247 ක පමණ කුලිය හිඟව පැවතුන අතර බොහෝ කඩ කාමර බදු දී තිබුණද බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි. සමහර ගිවිසුම්වල ගිවිසුම්ගත කාලය ඉක්මගොස් තිබුණද නැවත ගිවිසුම අළුත් කිරීමට කටයුතුකර නොතිබුණි.

(ii) කරගම්පිටිය පොදු වෙළඳපලේ කඩකාමර කුලියට දීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

- කරගම්පිටිය පොදු වෙළඳපලේ කඩ කාමර 19 ක් සඳහා බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි.
- මාසිකව අයකරන කුලිය වර්ෂ 3 කට වරක් තක්සේරු කර සංශෝධනය නොකිරීම නිසා මෙම කඩ කාමර වෙනුවෙන් දිගු කාලයක සිට රු.50 ක මාසික කුලියක් අයකර තිබුණි.
- කඩ කාමර 20 කින් 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කුලිය රු.12,273 ක් වුවද සභාවේ පොදු ක්‍රමවේදය අනුව මාස 03 ක කුලී එකතුවීමට ඉඩ නොහැරිය යුතු අතර කුලී නොගෙවන කඩ හිමියන් නෙරපා දැමීමට සභාව කටයුතුකර නොතිබුණි. එසේම කඩහිමියන්, සේවකයින් හා නියෝජිතයන් ආදීන්ගේ නම් ලියාපදිංචිකර ගැනීමට කටයුතුකර නොතිබුණු අතර කඩකාමර 08ක් අතුරු බදුදීම් කර තිබුණි.
- සමහර කඩකාමර ව්‍යාපාර කිරීමෙන් තොරව වසා දමා තිබුණු අතර අංක 06 කඩ කාමරය පුද්ගලයකු විසින් නිවසක් ලෙස භාවිතා කරමින් තිබුණි. එසේම සමහර කඩ කාමර පදිංචි පුද්ගලයන් විසින් සභාවේ අවසරයෙන් තොරව අළුත්වැඩියාකර තිබුණි.
- විගණනයට ඉදිරිපත්කරන ලද කඩ කාමර ලැයිස්තු අනුව අංක 24 එක් කඩකාමරයක් වශයෙන් දක්වා තිබුණද එම ස්ථානයෙහි වරිපනම් අංක 3 ක් යටතේ කඩකාමර 03 ක් පැවති අතර, කඩහිමියන් විසින් කඩකාමර කොටස් විශාලකර අලුතින් ඉදිකිරීම්කර තිබුණි. සභාවේ අවසරයකින් තොරව සිදුකරන ලද මෙම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) <u>වාහන භාවිතය</u>

i. සභාව සතු වාහන 13 ක් ගර්හිත තත්වයේ පැවති අතර ඉන් සමහර වාහන මාස 02 සිට වර්ෂ 05 ක් දක්වා කාලයක් නිශ්කාර්යව පැවතුණි.එසේම ගර්හිත තත්වයේ දිගු කාලයක් පැවති වාහන 03 ක් සඳහා එම කාලය මුළුල්ලේම ආදායම් බලපත්‍ර හා රක්ෂණ ගාස්තු ගෙවා තිබුණි.

ii. නගරාධිපතිවරයාගේ පාවිච්චිය සඳහා වාහන 02ක් වෙන්කර තිබුණු අතර 2016 ජනවාරි සිට ජූනි දක්වා මාස 6 ක කාලයක් සඳහා පෙට්‍රල් ලීටර් 2941 උපයෝජනය කර තිබුණි.

iii. ක්‍රියාවිරහිත වූ වාහන සම්බන්ධයෙන් සේවය ලබාදීම සඳහා වාහන 2 ක් යොදාගෙන තිබුණු අතර ධාවන සටහන් අනුව එක් එක් මාසයේ බොහෝ දිනවලදී මෙම රථ 2 ම ආපදා සේවාවන් සඳහා භාවිතා කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මාස තුනක කාලයකදී මෙසේ අපදා සේවය සඳහා මෙම වාහන දෙක වෙනුවෙන් ඉන්ධන ලීටර 750 ක් භාවිතා කර තිබුණු අතර මෙම වාහන පිටවූ වේලාව හෝ ආපසු පැමිණි වේලාව ධාවන සටහන්වල සටහන්ව නොතිබුණි.

(ඈ) <u>කායවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම</u>

සභා බල ප්‍රදේශයේ පැවති කායවර්ධන මධ්‍යස්ථාන 20 සඳහා රු.5,043,650 ක් වැයකර 2015 වර්ෂයේදි උපකරණ මිලදීගෙන තිබුණද මධ්‍යස්ථාන භාරකරුවන් ඒ පිළිබඳ නිපුනත්වයක් ඇති පුද්ගලයින් නොවීම, ඉන්වෙන්ට්‍රි ලේඛන යවත්කාලීනව නඩත්තුකර නොතිබීම ඉන්වෙන්ට්‍රි ලේඛනවල සඳහන් භාණ්ඩ භෞතිකව නොතිබීම, සමාජිකයන් ලියාපදිංචිකර ගැනීම සඳහා කටයුතු කර නොතිබීම වැනි අඩුපාඩු කායවර්ධන මධ්‍යස්ථානවල පැවතුණි.

(ඉ) <u>කසළ බැහැර කිරීම</u>

(i) සමාලෝචිත වර්ෂය සඳහා කසළ බැහැර කිරීම වෙනුවෙන් විධිමත් සැලසුමක් සභාව විසින් පිළියෙලකර නොතිබුණි.

(ii) කරදියාන අපද්‍රව්‍ය ඒකකයට කසළ බැහැර කිරීමේ දී භාවිතා කල වාහන පිළිබඳ 2016 අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලට අදාළ වාර්තාවන් අනුව සභාව විසින් යොදවා නොගත් බාහිර වාහන 12 කින් ප්‍රවාහනය කරනු ලැබූ කසළ ටොන් 56.95 ක් වෙනුවෙන් රු. 66,064 ක මුදලක් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට ගෙවා තිබුණි.

(iii) කසළ එකතු කිරීම නිසි පරිදි කළමණාකරනය නොකිරීම නිසා මුළු කසල ප්‍රමාණයෙන් සියයට 94 ක් මිශ්‍ර අපද්‍රව්‍ය ලෙස බැහැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදි රු.21,886,585 ක් වැඩිපුර ගෙවීමට සභාවට සිදුවී තිබුණි.

**3.2 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

**-------------------------------**

(අ) 2012 ජූලි 11 දිනැති අංක ඩබ්.පී/එල්.ජී.ඩී/01/2012 දරන පළාත් පාලන කොමසාරිස් (බ.ප)ගේ චක්‍රලේඛයේ (xiii) වන ඡේදය ප්‍රකාරව පළාත් පාලන ආයතනවල සැලසුම් කමිටුවේ සංයුතියට අනුකූල නොවන සේවකයින් කමිටුවලට සහභාගී කරවා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු දක්වා රු.104,000 ක් ගෙවා තිබුණි.

**3.3** හඳුනාගන්නා ලද පාඩු
-------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සේවය අත්හිටවූ සේවකයකු වෙනුවෙන් 2011 නොවැම්බර් 11 දින සිට 2016 අප්‍රේල් දක්වා සේවයට වාර්තා නොකල කාලය වෙනුවෙන් රු.1,413,903 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම මුදල් ආපසු අයකර ගැනීමට, කටයුතු කර නොතිබුණි.

(ආ) කඩකාමර සඳහා වෙන වෙනම ජල මාපකයන් සවිකිරිමෙන් තොරව ජල බිල්පත් ගෙවීමට පැවරීම නිසා ගල්කිස්ස සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩකාමර වෙනුවෙන් රු.100,442 ක ප්‍රමාද දඩ හා ජල සැපයුම නැවත ලබා ගැනීමේ ප්‍රතිස්ථාපන ගාස්තුවක් ගෙවීමට සිදුවී තිබුණු අතර ඉන් රු.44,344 ක ප්‍රමාණයක් සභාවට දැරිමට සිදුවී තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 210 (2) ප්‍රකාරව ගෙවීම් ප්‍රමාද කිරිම හේතුකොට කිසියම් ගාස්තුවක් ගෙවීමට සිදුවුවහොත් ඒ ගැන වගකිව යුතු නිලධාරීන්ගෙන් එම ගාස්තු අයකරගත යුතු වුවද සභාව විසින් විදුලි බිල්පත් ගෙවීම් කිරීමේදි නියමිත දිනට පෙර ගෙවීම් සිදු නොකර ප්‍රමාද කිරීම හේතුවෙන් 2014 වර්ෂයේ සිට 2016 දක්වා වූ කාල සීමාව සඳහා රු.132,343 ක් ඉක්මවා දඩ මුදල් ගෙවීමට සිදුවී තිබුණ අතර එම මුදල් වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර නොතිබුණි.

(ඈ) 2016 ජනවාරි 01 දිනට අයකරගතයුතු කසළ ආදායම රු.3,302,101 ක් වූ අතර ඉන් අයකරගත නොහැකි වූ රු.1,524,026 ක ප්‍රමාණය සමුච්චිත අරමුදලට කපාහැර තිබුණි.

**3.4** ආර්ථික නොවූ ගනුදෙනු
---------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නිවාස ලාභීන් විසින් ජල බිල්පත් ගෙවිය යුතු වුවද නියෝජ්‍ය නාගරික කොමසාරිස් නිල නිවසේ 2016 ජුලි මස දක්වා ජල බිල්පත වූ රු.87,845ක මුදල නිවාස ලාභියා විසින් නොගෙවීම හේතුවෙන් සභාව විසින් ගෙවීම්කර තිබුණු නමුත් එම මුදල අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගල්කිස්ස මවුන්ට් පාර්ක්හි දන්ත සායනය ගොඩනැගිල්ල ඉදිකිරීමේදී භාවිතා කල ජලය හා විදුලිය සඳහා පිළිවෙලින් රු.29,785 ක් හා රු.8275 ක මුදලක් සභාව විසින් ගෙවා තිබුණද එම මුදල් කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගෙන නොතිබුණි.

(ඇ) රජයේ බැංකු ගිනුම් වලින් අයිරා පහසුකම් ලබාගැනීම සිදු නොකල යුතු වුවත් සභාව විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමෙන් අයිරා පහසුකම ලබාගෙන තිබුනු අතර ඒ සඳහා රු.131,839 ක පොලියක් ගෙවා තිබුණි.

(ඈ) අනගාරික ධර්මපාල මාවත ආයුර්වේද ගොඩනැගිල්ලේ ජල නිවාරණ කටයුතු හා ඊට අදාළ අලුත්වැඩියාවන් ඉටුකිරීම සඳහා 2015 සැප්තැම්බර් 01 දින සිට මාස 10 ක කාල පරිච්ඡේදය තුළ පෞද්ගලික ආයතනයක් සමඟ දෙවරක් ගිවිසුම්වලට එළඹ රු.530,875ක් හා රු.579,325 ක් වශයෙන් එකතු වටිනාකම රු.1,110,200ක් වූ කොන්ත්‍රාත් 2 ක් ප්‍රදානය කර තිබුනද අදාල අලුත්වැඩියාවන් නිසිපරිදි සිදුකර නොතිබුණි.

## 3.5 නිශ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු වාහන 11 ක් මාස 10 සිට මාස 21 දක්වා කාලපරාසයක සිට අක්‍රීයව පැවතුණු අතර 2017 මැයි 30 දින වන විටත් අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු වාහන 13ක් දිගු කාලයක සිට භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතියද ඒවා අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව වෙත පවරාගෙන තිබූ කඩ කාමර 3ක් හා මුද්‍රා තබා ඇති කඩ කාමර 27 ක් නැවත පවරාගෙන වෙනත් බදුකරුවන් වෙත බදු දී ආදායම් ඉපයීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) සභාව සතු වාහනයක් 2015 ජනවාරි 17 දින අනතුරකට ලක්ව 2016 ජුනි 23 දින වන විටත් අළුත්වැඩියා කරමින් පැවතුණු බැවින් වර්ෂ 1 ඩ කට අධික කාලයක් ධාවන කටයුතු සඳහා යොදාගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) කාලයක සිට නිකුත් නොවන සහ කල් ඉකුත් වූ රු. 589,154ක් වටිනා තොග සභා ගබඩාවේ පැවතුණි.

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

i. බොහෝ කොන්ත්‍රාත් ව්‍යාපෘති ඉටුකිරීමේදී අමතර හා අතිරේක වැඩ සඳහා කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 10 ඉක්මවා ගෙවා තිබුණි.

ii. බොහෝ ව්‍යාපෘතීන්ට අදාළව වැඩ අවසන් වාර්තා සකස් කර නොතිබුණි.

## 3.7 කාර්ය මණ්ඩල පරිපාලනය

2016 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | 2016 දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
| මාණ්ඩලික ශ්‍රේණිය | 35 | 26 | 09 |
| ද්විතීය ශ්‍රේණිය | 343 | 270 | 73 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 1402 | 1378 | 24 |
| වෙනත් | - | | |
| කොන්ත්‍රාත් | 23 | 23 | - |
| උපාධිධාරී පුහුණු | - | 01 | - |
| | 1803 | 1697 | 106 |

සභාවේ ආරක්ෂක නියාමක හා මුරකරු තනතුර සඳහා බඳවාගත් නිලධාරීන් 20 දෙනෙකු අතරින් නිලධාරීන් 11 දෙනෙකු වෙනත් රාජකාරිවල යොදවා තිබුණි. සභාවේ ආරක්ෂක කටයුතු සඳහා පෞද්ගලික ආරක්ෂක සේවයක සේවය ලබාගෙන තිබුණු අතර 2016 වර්ෂය තුලදී ඒ වෙනුවෙන් රු.15,103,521 ක් පෞද්ගලික ආරක්ෂක සමාගමට ගෙවා තිබුණි.

## 4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------

### 4.1 අයවැය පාලනය

------------------

(අ) වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය, ආදායම් හා වියදම් වල සියයට 11 සිට සියයට 98 ක් දක්වා විචලනයන් පැවතුණු අවස්ථා 17 ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) මහජන සුභසාධනය සඳහා අයවැයගත කර තිබූ වියදම් විෂයයන් 51 ක එකතු වටිනාකම වූ රු.209,098,000 කින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඇ) ආදායම් ශීර්ෂ 07 ක් යටතේ ආදායම් විෂයයන් 07 ක අයවැයගත කර තිබූ රු.545,000 ක ආදායම් වලින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ආදායමක් එකතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ස්ථාවර වත්කම් පරිපාලනය
(ඉ) ණයගැති, ණයහිමි පාලනය
(ඊ) සේවක ණය කළමනාකරණය